# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 737/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 30/04/2024<br>පැය 1525 |

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.04.29 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 05 | 05 | 95 | 30 | යකඩ බැරල් 04<br>තඹ දඟර 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.04.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ඉඟුරුකඩේ හන්දිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 ක් එම ජාවාරමෙන් උපයා ගන්නා බවට සැකකරන මුදල් රුපියල් 2400/- ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 32 ක් වූ වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.04.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පෑලියගොඩ පොලිස් වසමේ කැලණිය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 90 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පෑලියගොඩ පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 28 ක් වූ කැලණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04.** **කසල තේ නැවත සකස් කොට මුදලට ලෙවි කිරීමට සුදානම් කරමින් සිටි සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තලවකැලේ කඳවුර**

2024.04.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තලවකැලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තලවකැලේ පොලිස් වසමේ වටගොඩ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **කසල තේ කිලෝ 17 ග්‍රෑම් 800 ක් නැවත සකස්කොට මුදලට අලෙවි කිරීම සඳහා සකස් කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගිණිගත්හේන, නුවරඑළිය තේ පර්යේෂණ කාර්යාලයේ තේ පරීක්ෂක නිලධාරී වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ වටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**05.** **බලපත්‍ර නොමැතිව නීති විරෝධීව පස් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුර.**

2024.04.29 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වව්නතිව් කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කරදියනාරු පොලිස් වසමේ කිතුල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව නීති විරෝධිව පස් කැණීම් කටයුතු සිදු කරමින් සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට කරදියනාරු පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වූ මඩකලපුව ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.** කරදියනාරු පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06.** **බලපත්‍ර නොමැතිව ගජමුතු වංචනික ලෙස විකිණීමට සුදානම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකාය කල්මුණ කඳවුර.**

2024.04.29 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කල්මුණ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මඩකලපුව පොලිස් වසමේ පුලියන්තිව් ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **ගජමුතු 11 ක් බලපත්‍ර නොමැතිව වංචනික ලෙස විකිණීම සඳහා සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මඩකලපුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වූ වෙංකෙලඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මඩකලපුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යන ලබයි.

**07.** **කේරළ ගංජා හා මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකාය උඩවලව කඳවුර.**

2024.04.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කුඩාඔය පොලිස් වසමේ රතවරා වැව් ඉස්මත්ත ප්‍රදේශයේ  දී වැටලීමක් සිදු කර **ගංජා කිලෝ 04 ක් ග්‍රෑම් 300 ක් හා මෙරට නිෂ්පාදිත ගිනි නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කුඩාඔය** පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**සැකකරු වයස අවුරුදු 58 ක් වූ ඌව කුඩාඔය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** කුඩාඔය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යන ලබයි.

**08.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකාය අම්බලන්තොට කඳවුර.**

2024.04.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්තොට කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අම්බලන්තොට පොලිස් වසමේ බැරගම ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අම්බලන්තොට පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන අම්බලන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ. අම්බලන්තොට පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**